# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,370 - 2024 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2024.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 4 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 පෙබරවාරි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

01- B 82529 — 5,403 (2024/01)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

**ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම**

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අංක 2199/10 දරන 2020.10.27 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා ඊට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාරව පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රේඛීය අමාත්‍යාංශය/පළාත් සභා/පළාත් පාලන ආයතනවල සේවය කරන ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ සුදුසුකම්* :

i. ආයුර්වේද වෛද්‍ය සේවයේ II වන ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක ආයුර්වේද වෛද්‍ය නිලධරයෙකු වීම.

ii. ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ IV පරිශිෂ්ඨයේ දැක්වෙන අයුරු යම් විෂයයක් පිළිබඳව ශ්‍රී ලංකා රජය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයක අවුරුදු 03කට නොඅඩු පූර්ණ කාලීන ආයුර්වේද/සිද්ධ/යුනානි වෛද්‍ය විශාරද (Doctor of Medicine) හෝ ආයුර්වේද/සිද්ධ/යුනානි ශල්‍ය විශාරද (Mater of Surgery) පශ්චාත් උපාධියක් ලබා තිබීම හා අදාළ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් එය සහතික කර තිබීම.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iv. ඉහත i හා ii හි සඳහන් සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව හඳාරණ ලද විෂයයට අදාළව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ වසර 02කට නොඅඩු පූර්ණකාලීන සායනික සහ පර්යේෂණ පුහුණුවක් ලබා ගැනීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයුර්වේද/සිද්ධ/යුනානි පශ්චාත් උපාධි ආයතනයක පිහිටවනු ලබන අධ්‍යයන මණ්ඩලයේ (Board of Study) ලියාපදිංචි සහතිකයක් (Board Certificate) ලබා තිබීම.

**සටහන.-**

ඉහත iv හි සඳහන් අධ්‍යයන මණ්ඩලය පිහිටුවන තෙක් ඉහත i සිට iii දක්වා වන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව හදාරණ ලද විෂයට අදාළව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ වසර 02ට නොඅඩු පූර්ණ කාලීන සායනික හා පර්යේෂණ පුහුණුවක් ලබා තිබීම යන සුදුසුකම් පමණක් සලකා විශේෂඥ ශ්‍රේණියට උසස් කරනු ලැබේ. පවතින පුරප්පාඩු අනුව මධ්‍යම රජය යටතේ සහ පළාත් සභා යටතේ ඇති රෝහල් වෙත අනුයුක්ත කරනු ලැබේ.

*උසස්වීම් ක්‍රමය* :

තනතුරු පුරප්පාඩු ඇතිවන අවස්ථාවේ දී (සෑම වර්ෂයකම ජනවාරි මස 01 වැනි දිනට සහ ජූලි මස 01 දිනට) සේවයේ නියුතු ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද ආයුර්වේද වෛද්‍ය නිලධරයන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. පත්කිරීම් බලධරයා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම හා එයට අදාළවන ලකුණු පටිපාටිය අනුමත කිරීම සිදු කරනු ලබන අතර, ඒ අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ද සහිතව පත්කිරීම් බලධරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් පසුව උසස්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ඉහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපනික හා වෘත්තීය පළපුරුද්ද සම්බන්ධ සහතික හා ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

02. 2023.01.01 දිනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව :

| අනු අංකය | ආයතනය/පළාත් සභා | පුරප්පාඩු | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2020.01.01 2020.06.30 | 2020.07.01 2020.12.31 | 2021.01.01 2021.06.30 | 2021.07.01 2021.12.31 | 2022.01.01 2022.06.30 | 2022.07.01 2022.12.31 | 2023.01.01 |
| 01. | ආයුර්වේද ජාතික රෝහල - බොරැල්ල | 06 | 06 | 08 | 09 | 04 | 04 | 05 |
| 02. | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය | 03 | 03 | 03 | 03 | 02 | 02 | 03 |
| 03. | බස්නාහිර පළාත | 10 | 10 | 09 | 08 | 08 | 08 | 07 |
| 04. | දකුණු පළාත | 09 | 09 | 09 | 09 | 09 | 09 | 09 |
| 05. | වයඹ පළාත | 08 | 08 | 08 | 07 | 05 | 05 | 05 |
| 06. | මධ්‍යම පළාත | 09 | 09 | 09 | 08 | 08 | 08 | 08 |
| 07. | සබරගමුව පළාත | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 |
| 08. | ඌව පළාත | 08 | 08 | 08 | 08 | 08 | 08 | 08 |
| 09. | උතුරු මැද පළාත | 07 | 07 | 07 | 07 | 07 | 07 | 07 |
| 10. | නැගෙනහිර පළාත | 09 | 09 | 09 | 09 | 09 | 09 | 09 |
| 11. | උතුරු පළාත | 08 | 08 | 08 | 08 | 11 | 11 | 11 |
| | **එකතුව** | **87** | **87** | **88** | **86** | **81** | **81** | **82** |

***සටහන*** : විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඉහත සුදුසුකම් සපුරා තිබූ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැක.

03. ඉහත සඳහන් පරිදි සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මේ සමඟ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව (අයදුම්පත www. ayurveda.gov.lk ඔස්සේ ද ලබාගත හැක.) සකස් කරන ලද අයදුම්පත් **2024.03.04** දිනට පෙර ආයතන ප්‍රධානියා මගින් ද දැනට විශ්‍රාම ලබා ඇති ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් පෞද්ගලිකව ද, ''ආයුර්වේද කොමසාරිස් ජනරාල්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

04. විශේෂඥ ශ්‍රේණියේ තනතුරක ආරම්භක වැටුප් පියවර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව SL-3-2016ට අදාළව (රු. 88,000 - 12 x 2700 -රු. 120,400) වේ.

05. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට අදාළ ලකුණු ලබාදීමේ පටිපාටිය පහත පරිදි වේ. :

1. සේවා කාලය :

(උපරිම ලකුණු 60)

ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ සේවා කාලය ලකුණු 30
(සෑම වසරක් සඳහා ම ලකුණු 02 බැගින්)

ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය ලකුණු 30
(සෑම වසරක් සඳහා ම ලකුණු 05 බැගින්

***සටහන*** :

(ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබාදීමේ දී, වසරකට අඩු කාලයක් සඳහා සමානුපාතික ලෙස රා. සේ. කො. චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධානවලට අනුකූලව සිදු කරනු ලැබේ.)

2. පළපුරුද්ද : (උපරිම ලකුණු 20)

පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු වසර දෙකක පූර්ණ කාලීන සායනික/පර්යේෂණ පුහුණුවෙන් පසුව එළඹෙන සෑම වසරක් සඳහා ම සායනික/පර්යේෂණ ක්ෂේත්‍රයෙ හි සේවය කිරීම වෙනුවෙන් ලකුණු 02 බැගින්

3. ක්ෂේත්‍රයට අදාළ අමතර අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් : (උපරිම ලකුණු 20)
i. අධ්‍යාපන සුදුසුකම් : (ලකුණු 10)

(අ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට සම්බන්ධිත විද්‍යාපති (M.sc.) ලකුණු 06

(ආ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට සම්බන්ධිත දර්ශනවේදී (M.Phill) හෝ වෛද්‍ය විශාරද (MD) (අධ්‍යයන මණ්ඩල සහතික ලබා නොමැති) ලකුණු 08

(ඇ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට සම්බන්ධිත දර්ශනපති (Ph.D) හෝ වෛද්‍ය විශාරද (MD) (අධ්‍යයන මණ්ඩල සහතික ලබා ඇති) ලකුණු 10

සටහන :

ඉහත අංක 1 හි (මූලික සුදුසුකම්) සුදුසුකම් යටතේ අදාළ කර ගනු ලැබූ අධ්‍යාපන සුදුසුකම් සඳහා මෙහි දී ලකුණු ලබා නොදෙන අතර ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

i. පර්යේෂණ සහ ප්‍රකාශන :
අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ ප්‍රකාශන සඳහා (ලකුණු 10)
i. අදාළ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර මට්ටමේ එක් පර්යේෂණයක් සහ ප්‍රකාශනයන් සඳහා ලකුණු 10 බැගින්
ii. අදාළ ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ එක් පර්යේෂණයක් සහ ප්‍රකාශන ග්‍රන්ථයක් සඳහා ලකුණු 05 බැගින්

සටහන :

පර්යේෂණ සහ ප්‍රකාශන ඇගයීමේ දී ඇමුණුම 01 හි සඳහන් නිර්ණායක පදනම් කර ගනු ලැබේ.

(මුළු ලකුණු 100)

06. තෝරාගන්නා ක්‍රමය :

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ අධ්‍යාපන, වෘත්තීය, සේවා පළපුරුද්ද, ජ්‍යෙෂ්ඨතාවය සම්බන්ධ සහතික හා ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ඉහත සඳහන් ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්, අදාළ දිනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව මගින් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කරනු ලැබේ.

07. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

වෛද්‍ය පී. ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

2024 ජනවාරි මස 24 වැනි දින,
සුවසිරිපාය,
කොළඹ 10.

ඇමුණුම 01

ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කරගත යුතු නිර්ණායක :

I. ප්‍රකාශන :

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක්කර ඇති අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්,

(ආ) සමුළු පත්‍රිකා/උධෘත/අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා,
ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යාපන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදා ගත් වාර්තා

II. කතෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ඇත.

III. එකම දත්ත/පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝ දුරට සමාන නිගමනයන්ට එළඹී ඇති ප්‍රකාශන වෙන් වෙන් ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවක දී ලකුණු ලබාදීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත

01. මුලකුරු සමග නම :————.

02. සම්පූර්ණ නම :————.

03. උපන් දිනය :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. (i) ස්ථිර ලිපිනය :————.
(ii) දුරකථන අංකය :————.

06. (i) සේවා ස්ථානයේ ලිපිනය :————.
(ii) දුරකථන අංකය :————.

07. (i) මුල් පත්වීමේ දිනය :————.
(ii) වර්තමාන ශ්‍රේණිය :————.
(iii) II ශ්‍රේණියට පත්වූ දිනය :————.
(iv) 2022.06.30 දිනට II ශ්‍රේණියේ සේවා කාලය :————.
(v) I ශ්‍රේණියට පත්වූ දිනය :————.
(vi) 2022.06.30 දිනට I ශ්‍රේණියේ සේවා කාලය :————.

08. ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම් :
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව)

| ආයතනය | පාඨමාලාවේ නම | කාලය | සම්පූර්ණ කළ දිනය (පුහුණු කාලය ඇතුළත්ව) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

09. ලබා ඇති පශ්චාත් උපාධිය ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ IV පරිශිෂ්ඨයට අනුව කුමන විෂයය ධාරාවට අයත් වන්නේ ද යන වග :————.

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

දිනය :————. අත්සන:————.

**ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

.................................... මයා/මිය/මෙනෙවිය විසින් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත මේ සමග ඉදිරිපත් කරනු ලබන අතර, එහි සඳහන් තොරතුරු නිවැරදි බවත්, පූර්වාසන්න වසර 05 තුළ නිලධාරියා/නිලධාරිනිය සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 05 තුළ නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති*/නොමැති බවත් සහතික කරමි.

දිනය :————.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

* විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇතිනම් ඒ පිළිබඳව සඳහන් කළ යුතුය.

* අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කරන ලද අයදුම්පත් සම්මුඛ පරීක්ෂණය වෙත ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන බවත්, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බවත් වැඩිදුරටත් දන්වමි.

02-113

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ධීවර අමාත්‍යාංශය**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නාවික ඉංජිනේරු සහකාර III ශ්‍රේණිය (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය -2024

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නාවික ඉංජිනේරු සහකාර III ශ්‍රේණියේ පවතින පුරප්පාඩුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ  සේවයේ නියුතු සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීම තරග විභාගයක ප්‍රතිඵල මත සිදුකෙරෙන අතර එම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 මැයි මස කොළඹදී පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications- Recruitment Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2024 පෙබරවාරි මස 02 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2024 මාර්තු 01 වේ.**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නාවික ඉංජිනේරු සහකාර තනතුරෙහි පවතින පුරප්පාඩු 04ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන දැනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ  සේවයේ නියුතු සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. අනුමත යාත්‍රාංගනවල නිෂ්පාදිත හා නිෂ්පාදනය වෙමින් පවතින ධීවර යාත්‍රා, පාරම්පරික ධීවර යාත්‍රා පරීක්ෂණ වාර්තා, තක්සේරු වාර්තා හා මුහුදු යෝග්‍යතා සහතික ලබාදීම. යාත්‍රා ලියාපදිංචිය හා රක්ෂණය කිරීම සඳහා ද අදාළ තාක්ෂණ වාර්තා, මුහුදු යෝග්‍යතා සහතික ලබාදීම හා ධීවර යාත්‍රාවල උපාංග සඳහා තක්සේරු වාර්තා, පරීක්ෂණ වාර්තා ලබාදීම හා අදාළ තාක්ෂණික කටයුතු. යාත්‍රාංගන හා එන්ජින් ආදී යාත්‍රා උපාංග සැලසුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් තාක්ෂණික නිරීක්ෂණ හා නිර්දේශ, යාත්‍රාංගන හා උපාංග සැලසුම්කරුවන් මගින් ලබා දීමට නියමිත යාත්‍රා සැලසුම් හා උපාංගවල පිරිවිතර ආදිය සඳහා නිර්දේශ ලබා දීම. දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳ කාර්මික හා යාන්ත්‍රික තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දීම හා වාහන අලුත්වැඩියාවෙන් පසු නැවත පරීක්ෂා කර ගෙවීම් නිර්දේශ ලබා දීම රාජකාරිවලින් සමන්විත තනතුරකි.

01. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත් ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් නාවික ඉංජිනේරු සහකාර (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) III ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. *වැටුප් කාණ්ඩය සහ පරිමාණය* :

වැටුප් කේත අංකය : MN 3-2016
වැටුප් පරිමාණය : රු. 31,040- 10 x 445-11 x 660 - 10 x 730 - 10 x 750 - x රු. 57,550/-

03. *අධ්‍යාපන සුදුසුකම්* :

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය හා විද්‍යාව යන විෂයනට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයයන් 6කින් සමත්වීම.

04. *වෘත්තීය සුදුසුකම්* :

(i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

05. පළපුරුද්ද :

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන හෝ ඉන් ඉහළ සේවා ගණයක දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

06. කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. වෙනත් :

(i) නියමිත දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම;

(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 3 හා 4 හි දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. වයස් සීමාව : අදාළ නොවේ

09. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය, සිංහල හා දෙමළ භාෂාවලින් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

10. ලිඛිත විභාගය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

විෂය නිර්දේශය පහතින් දැක්වේ,

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | සංඛ්‍යාමය හැකියාව,ගැටලු නිරාකරණය,තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I වන කොටස<br>පරිසරය, විද්‍යාත්මක සොයා ගැනීම්, විද්‍යා දැනුම, ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ බහුවරණ ප්‍රශ්නවලින් යුක්තය.<br>II වන කොටස<br>විෂයානුබද්ධ ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් යුක්තය. |

11. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ වේ.

12. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන* :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න.

14. විභාගයට ඇතුළත් වීම :

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයදුම් කිරීමේදී ලැබෙන යොමු අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ප්‍රතිඵලදායි වනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකු ම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු

විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. **සැලකිය යුතුය :**

අ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

ආ. විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු අතර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් හා සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

17. පත් කිරීම සඳහා තෝරා ගැනීම :

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

18. ප්‍රතිඵල නිකුත් කිරීම :

අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මඟින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

19. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

20. සිංහල, දෙමළ මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද නිවේදනය බලාත්මක වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2024 ජනවාරි 24 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

02-28

---

## ධීවර අමාත්‍යාංශය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නාවික ඉංජිනේරු සහකාර III ශ්‍රේණිය (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) සඳහා රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන් අතරින් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2024

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නාවික ඉංජිනේරු සහකාර III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.බඳවා ගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත සිදු කරන අතර එම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 මැයි මස කොළඹ දී පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services " යටතේ ඇති "Online Applications-Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2024 පෙබරවාරි මස 02 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024 මාර්තු මස 01 වේ.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නාවික ඉංජිනේරු සහකාර තනතුරෙහි පවතින පුරප්පාඩු 06ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත සුදුසුකම් ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. අනුමත යාත්‍රාංගනවල නිෂ්පාදිත හා නිෂ්පාදනය වෙමින් පවතින ධීවර යාත්‍රා,පාරම්පරික ධීවර යාත්‍රා පරීක්ෂණ වාර්තා, තක්සේරු වාර්තා හා මුහුදු යෝග්‍යතා සහතික ලබා දීම. යාත්‍රා ලියාපදිංචිය හා රක්ෂණය කිරීම සඳහා ද අදාළ තාක්ෂණ වාර්තා, මුහුදු යෝග්‍යතා සහතික ලබා දීම හා ධීවර යාත්‍රාවල උපාංග සඳහා තක්සේරු වාර්තා, පරීක්ෂණ වාර්තා ලබා දීම හා අදාළ තාක්ෂණික කටයුතු, යාත්‍රාංගන හා එන්ජින් ආදී යාත්‍රා උපාංග සැලසුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් තාක්ෂණික නිරීක්ෂණ හා නිර්දේශ , යාත්‍රාංගන හා උපාංග සැලසුම්කරුවන් මඟින් ලබා දීමට නියමිත යාත්‍රා සැලසුම් හා උපාංගවල පිරිවිතර ආදිය සඳහා නිර්දේශ ලබා දීම, දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳ කාර්මික හා යාන්ත්‍රික තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දීම හා වාහන අලුත්වැඩියාවෙන් පසු නැවත පරීක්ෂා කර ගෙවීම් නිර්දේශ ලබා දීම යන රාජකාරිවලින් සමන්විත තනතුරකි.

01. සේවා කොන්දේසි :

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් නාවික ඉංජිනේරු සහකාර (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) III ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :

වැටුප් කේත අංකය : MN 3-2016
වැටුප් පරිමාණය : රු. 31,040- 10x445-11x660 - 10x730 - 10x750 - x රු. 57,550/-

03. අධ්‍යාපන සුදුසුකම් :

ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව/ ඉංජිනේරු තාක්ෂණවේදය / තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් දෙක (02) ක් සහිතව විෂයන් තුන (03) කින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂා, විද්‍යා, ගණිත සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

04. වෘත්තීය සුදුසුකම් :

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු/ නාවික ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව;

*හෝ*

III. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

IV. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු උසස් තාක්ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

V. ශ්‍රී ලංකා නාවික හමුදා නාවික ශිල්ප පුහුණු ආයතනය විසින් පිරිනමනු ලබන නාවික ඉංජිනේරු ඩිප්ලෝමාව.

05. පළපුරුද්ද : අදාළ නොවේ

06. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක (ශ්‍රී ලංකා භූමියට අයත් දූපත් ද සහිත) සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. වෙනත් :

(i) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) අයදුම්පත් කැඳවන දිනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු විය යුතුය.
(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබීම.

08. වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2006.03.01 දින හෝ ඊට පෙර හා 1994.03.01දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

09. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙ හි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

10. ලිඛිත විභාගය :

| විෂයයන් | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | සංඛ්‍යාමය හැකියාව, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I වන කොටස<br>පරිසරය, විද්‍යාත්මක සොයා ගැනීම්, විද්‍යා දැනුම, ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ බහුවරණ ප්‍රශ්නවලින් යුක්තය.<br>II වන කොටස<br>විෂයානුබද්ධ ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් යුක්තය. |

11. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ වේ.

12. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන* :-

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ද භාරගනු නොලැබේ.

14. විභාගයට ඇතුළත් වීම :

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකු ම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. **සැලකිය යුතුය :**

(අ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරින් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් හා සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

17. පත් කිරීම සඳහා තෝරා ගැනීම :

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

18. ප්‍රතිඵල නිකුත් කිරීම :

අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මඟින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

19. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද නිවේදනය බලාත්මක වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2024 ජනවාරි 24 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

02-29

---

## ධීවර අමාත්‍යාංශය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණිය සඳහා රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන් අතුරින් බඳවා ගැනීමේ තරග විභාගය - 2024

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියේ පවතින පුරප්පාඩුවලට බඳවා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත සුදුසුකම්ලත් නිලධරයන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීම තරග විභාගයක ප්‍රතිඵල මත සිදු කරන අතර එම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2024 මැයි මස කොළඹ දී** පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2024 පෙබරවාරි මස 02 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2024 මාර්තු 01 වේ.**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දිවයින පුරා පිහිටි වෙරළාසන්න දිස්ත්‍රික් 15 ක කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී තනතුරෙහි පවතින **පුරප්පාඩු 23 ක්** සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සුදුසුකම්ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මුහුදේ දී ධීවර කාර්මිකයන්ට සහ ධීවර යාත්‍රාවලට වන ආපදා සම්බන්ධව කටයුතු කිරීම, දිනපතා ධීවර කාර්මිකයන්ට අදාළ කාලගුණ වාර්තා සැපයීම, ධීවර ප්‍රාදේශීය කාර්යාලවල පණිවිඩ හුවමාරු සඳහා සම්බන්ධ වීම, ධීවර යාත්‍රා සමග පණිවුඩ හුවමාරුව, ඔවුන්ගේ යාත්‍රා හිමියන්ට සහ අවශ්‍ය අයට තොරතුරු ලබා දීම, නවීන තාක්ෂණය මඟින් විධිමත්ව ධීවර කාර්මිකයන්ට තොරතුරු ලබාදීමට සලසා ඇති ක්‍රමවේද පවත්වාගෙන යාම හා පැය 24 පුරාම ධීවර කාර්මිකයන්ට තොරතුරු ලබා දීම යන රාජකාරිවලින් සමන්විත තනතුරකි. (රාත්‍රී වැඩ මුර අනිවාර්ය වේ.)

1. සේවා කොන්දේසි :

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි III ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

2. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :
වැටුප් කේත අංකය : MT 1 2016
වැටුප් පරිමාණය : රු.29,840- 10x300 - 11x350 - 10x560 - 10x660 -රු. 48,890/-

3. අධ්‍යාපන සුදුසුකම් :

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

*හා*

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. පැරණි විෂය නිර්දේශය විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

4. වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විදුලි සංදේශ හෝ ගුවන් විදුලි කටයුතු පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (5) මට්ටමට ඇතුළත් වන්නා වූ පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

5. පළපුරුද්ද : අදාළ නොවේ.

6. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක (ශ්‍රී ලංකා භූමියට අයත් දූපත් ද ඇතුළු) සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7. වෙනත් සුදුසුකම් :

I. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. අයදුම්පත් කැඳවන දිනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු විය යුතුය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

8. වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වනවිට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.(ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2006.03.01 දින හෝ ඊට පෙර හා 1989.03.01 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

9. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවා බඳවා ගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය, සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂාවෙන් පමණක් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

10. ලිඛිත විභාගය :

III ශ්‍රේණිය සඳහා

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනුම | 100 | 40 |
| 3. විෂයානුබද්ධ තාක්ෂණික පරිසරය | 100 | 40 |

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශ |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | සංඛ්‍යානමය හැකියාව, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. |
| සාමාන්‍ය දැනුම | ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය, ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හී වැදගත් සිද්ධීන් ද අදාළව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබන බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 1. රිසිවරය :<br>A.M.F.M.N.M.SSB.CW අධිහෙටිරොඩයින් (Superhetrodyne) කාර්යයන් හා පාලක<br><br>2. සම්ප්‍රේෂක - CW, AM, FM<br>විකාශන සංඥා භාර ගැනීම, මෝස් සංඥා යැවීම, බලධාරික සකස් කිරීමේ අදියර, SWR-SWR මීටර් භාවිතයේ වැදගත්කම, හාමොනික් හා ව්‍යාජ විකිරණ.<br><br>3. සම්ප්‍රේෂක මාර්ග සහ සටහන් :<br>අනුනය කරන හා සමාන්තර කළ මාර්ග බාධක<br><br>4. අන්තන :<br>සිරස්, ද්විත්ව, යාගි අන්තන, අන්තන වාසිය, උසෙහි බලපෑම, ධ්‍රැවීකරණය<br><br>5. තරංග ව්‍යාප්තිය :<br>අයනීකරණය, අයන ගෝලයේ ස්ථර, සූර්යය ලප, MUF, LUF, OTF අවධි සංඛ්‍යානය, පැනුම් දුර ප්‍රමාණය, පැනුම් කලාපය, එලදායි උස, අහස් තරංග, ඍජු තරංග හීන කිරීම.<br><br>6. පණිවුඩ හුවමාරු කිරීමේ මූලිකාංග :<br>සයින් තරංග, තරංග කාලය, සංඛ්‍යාතය, ස්පිකරය, මයික්‍රපෝනය, පරිමාණමකය, විවිධ ප්‍රති ග්‍රහණය, ඩෙසිබෙල්, බැටරි නඩත්තු ප්‍රතිරෝධය, ධාරිතා බලය හා ආනයිතය.<br><br>7. මිනුම් උපකරණ :<br>VOM තාප විද්‍යුත් යුගිම මීටර, කපාට වෝල්ටි මීටරය, අවපාතික මීටරය, SWR මීටරය RF වෝල්ටි මීටරය, මෙගර්<br><br>8. පරිපථ හා ඇමුණුම් උපකරණ :<br>ට්‍රාන්සිස්ටර් ක්‍රියාකරවීමේ මූලධර්ම, ට්‍රාන්සිස්ටර් ක්ෂේත්‍රඵලය, ලෝහ ඔක්සයිඩ් අර්ධ වාහන ට්‍රාන්සිස්ටර්, කපාට AF හා RF විකාශන යන්ත්‍රවල සරල පරිපථ ඇතුළුව මූලික පරිපථ කාර්යයන්, දෝලකය, මිශ්‍රකය, දෝෂකය, බල සැපයුම් සංඛ්‍යාත ගොනුකිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

11. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* : අදාළ වේ.

12. *විභාග ගාස්තු* :
විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

   i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
   ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
   iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
   iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන* :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

13. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. *විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම* :

*ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ඵලදායි වනු ඇත.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. *සැලකිය යුතුය* :

අ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

ආ. විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී

ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

17. ***පත් කිරීම සඳහා තෝරා ගැනීම*** :

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවා බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. තනතුරුවලට අදාළ නිලධාරීන් බඳවා ගැනීමේ දී හුදෙක් සුදුසුකම්, සහතික සහ මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි.

18. ***ප්‍රතිඵල නිකුත් කිරීම*** :

අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

19. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම නිවේදනයෙ හි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද නිවේදනය බලාත්මක වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2024 ජනවාරි මස 24 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

02-30

---

## ධීවර අමාත්‍යාංශය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරි (සිවිල්) (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) සඳහා දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන් අතුරින් බඳවා ගැනීමේ තරග විභාගය - 2024 වර්ෂය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) පුරප්පාඩුවලට බඳවා ගැනීමේ තරග විභාගය සඳහා දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත සුදුසුකම්ලත් නිලධරයන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර එම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2024 මැයි මස කොළඹ** දී පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2024 පෙබරවාරි මස 02 වැනි දින පෙ. ව. 9.00ට විවෘත වේ.**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2024 මාර්තු මස 01 වේ.**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරෙ හි පවතින පුරප්පාඩු 01ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත සුදුසුකම්ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. ගොඩනැගිලි ඉදිකිරීම, නවීකරණය හා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම, මැනීම හා මට්ටම් ගැසීම, ප්‍රමාණ සමීක්ෂණය, ගොඩනැගිලි නිර්මාණය හා පවිත්‍රතා කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය යන රාජකාරිවලින් සමන්විත තනතුරකි.

01. ***සේවා කොන්දේසි*** :

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් තාක්ෂණ නිලධාරි (සිවිල්) (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. *වැටුප් කාණ්ඩය සහ පරිමාණය :*

වැටුප් කේත අංකය : MN 3-2016

වැටුප් පරිමාණය : රු. 31,040- 10 x 445-11 x 660 - 10 x 730 - 10 x 750 - x රු. 57,550/-

03. *අධ්‍යාපන සුදුසුකම් :*

ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව/ ඉංජිනේරු තාක්ෂණවේදය / තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙක (02) ක් සහිතව විෂයයන් තුනකින් (03); අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

04. *වෘත්තීය සුදුසුකම් :*

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව ;

*හෝ*

III. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු තාක්ෂණ ඩිප්ලෝමාව ;

*හෝ*

IV. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

05. *පළපුරුද්ද :* අදාළ නොවේ.

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් :*

(i) සෑම අයදුම්කරුවකු ම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන අයෙකු විය යුතුය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

08. *වයස් සීමාව :*
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2006.03.01 දින හෝ ඊට පෙර හා 1994.03.01 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

09. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

10. *ලිඛිත විභාගය :*

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | සංඛ්‍යාමය හැකියාව, ගැටළු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I වන කොටස : පරිසරය, විද්‍යාත්මක සොයා ගැනීම්, විද්‍යා දැනුම, ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ බහුවරණ ප්‍රශ්නවලින් යුක්තය. II වන කොටස : විෂයානුබද්ධ ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් යුක්තය. |

.

11. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ වේ.

12. *විභාග ගාස්තුව* :

විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන* :-

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

13. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. *විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම* :

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයදුම් කිරීමේ දී ලැබෙන යොමු අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු

අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකු ම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ මුල පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. *සැලකිය යුතුය* :

අ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

ආ. විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් හා සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

17. පත් කිරීම සඳහා තෝරා ගැනීම :

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

18. ප්‍රතිඵල නිකුත් කිරීම :

අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

19. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම නිවේදනයෙ හි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද නිවේදනය බලාත්මක වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2024 ජනවාරි මස 24 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

02-31

## ධීවර අමාත්‍යාංශය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - බණ්ඩ 02 සේවා ගණයේ තත්ත්ව පාලන නිලධාරි II ශ්‍රේණියේ තනතුර සඳහා රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන් අතුරින් බඳවා ගැනීමේ තරග විභාගය - 2024

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - බණ්ඩ 02 සේවා ගණයේ) තත්ත්ව පාලන නිලධාරි II ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීම තරග විභාගයක ප්‍රතිඵල මත සිදු කරන අතර එම තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 මැයි මස කොළඹ දී පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2024 පෙබරවාරි මස 02 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2024 මාර්තු 01 වේ.**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - බණ්ඩ 02 සේවා ගණයේ) තත්ත්ව පාලන නිලධාරි II ශ්‍රේණියේ තනතුරෙ හි පවතින පුරප්පාඩු 08 ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සුදුසුකම්ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. ධීවර යාත්‍රා, මසුන් වෙන්දේසි ස්ථාන, මසුන් ගොඩබාන ස්ථාන, මත්ස්‍ය ගබඩා, අපනයනය සඳහා මත්ස්‍ය නිෂ්පාදන සකස් කරන ස්ථාන හා මසුන් අලෙවි කරන ස්ථාන පරීක්ෂා කිරීම, නිල සාම්පල (අයිස්, ජලය, මසුන්, මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදන යනාදිය) ලබා ගැනීම හා ඒවා පර්යේෂණාගාර වෙත ලබාදීම, පරීක්ෂණ වාර්තා විශ්ලේෂණය කිරීම, ධීවර නිෂ්පාදන පරීක්ෂා කිරීමට අවශ්‍ය පර්යේෂණාගාර අනුමත කිරීම සඳහා පරීක්ෂා කිරීම, අනුමැතියෙන් පසු අවශ්‍ය තත්ත්වයන් පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම, ධීවර නිෂ්පාදන සඳහා නිකුත් කරනු ලබන ස්වස්ථතා සහතික සහතික කිරීම, මත්ස්‍ය නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිත භාවය තහවුරු කිරීමේ ක්‍රම වේදය විගණනය කිරීම, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිකුත් කරනු ලබන පරීක්ෂණ සහ විශ්ලේෂණයන් අධීක්ෂණය කිරීම, ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව හා යුරෝපා ආර්ථික කොමිෂමේ තීරණායකයන්ට අනුව මත්ස්‍ය අපනයන කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම, නව තාක්ෂණය හා තත්ත්ව පාලන කළමනාකරණ ක්‍රම පිළිබඳව මත්ස්‍ය අපනයනකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, මත්ස්‍ය වගා කිරීමේ කටයුතුවල නිරතවන ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යනාදිය මෙම තනතුරේ රාජකාරි වේ.

01. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් තත්ත්ව පාලන නිලධාරි II ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :
වැටුප් කේත අංකය : MN 5 -2016
වැටුප් පරිමාණය : රු. 34,605 - 10 x 660 - 11 x 755 - 15 x 930 - රු. 63,460/-

03. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ධීවර විද්‍යාව, ආහාර විද්‍යාව, ආහාර තාක්ෂණ විද්‍යාව යන විෂයන්ගෙන් අවම වශයෙන් විෂයන් දෙකක් ඇතුළත් විද්‍යාවේ දී උපාධියක් ලබා තිබීම ;

*හෝ*

ඉහත විෂයන්ගෙන් අවම වශයෙන් විෂයන් දෙකකින් යුක්තව කෘෂිකර්මය පිළිබඳව විද්‍යාවේ දී උපාධියක් ලබා තිබීම ;

*සහ*

(ආ) උපාධි පාඨමාලාවක ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත් වී තිබීම ;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ඉංග්‍රීසි භාෂාව විෂය සමත්වී තිබීම ;

*හෝ*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමර්ථය ලබා තිබීම ;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමත් වී තිබීම.

04. *වෘත්තීය සුදුසුකම්* : අදාළ නොවේ.

05. *පළපුරුද්ද* : අදාළ නොවේ.

06. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. *වෙනත්* :
(i) සෑම අයදුම්කරුවකු ම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) අයදුම්පත් කැඳවන දිනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු විය යුතුය.
(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

08. *වයස් සීමාව* :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2003.03.01 දින හෝ ඊට පෙර හා 1989.03.01 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

09. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% කට නොඅඩුව ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාව අනුව ඉහළම ලකුණු ලබාගත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර කුසලතා අනුපිළිවෙළින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ.

(අ.) බඳවා ගැනීමේ තරග විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ඇත.

(ආ.) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් අයදුම්කළ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

10. *ලිඛිත විභාගය* :

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| I. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| II. රචනය හා සාරාංශය | පැය 01 1/2 | 100 | 40% |
| III.සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

10.1 විෂය නිර්දේශය පහතින් දක්වා ඇත.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| I. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීම අරමුණු කොටගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්ණ පත්‍රයකි. |
| II. රචනය හා සාරාංශය | කාලීන සමාජීය සිදුවීමක් පිළිබඳ ප්‍රකාශයක් හෝ සාකච්ඡා සටහනක් කියවා අවබෝධකොට ගෙන විග්‍රහකර දැක්වීම පිළිබඳ හැකියාව මැනීම හා රචනය/සාරාංශකරණය කිරීමේ හැකියාව මැනීම පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |
| III. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය, ආර්ථික,වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන් හි වැදගත් සිද්ධීන් ද අදාළව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනීම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. |

11. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* ඃ අදාළ වේ.

12. *විභාග ගාස්තුව* ඃ

විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන ඃ-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

13. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* ඃ

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව ගෙවීම් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

14. *විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම* ඃ

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වු පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ඵලදායි වනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. *සැලකිය යුතුය* :

අ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

ආ. විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

17. *පත් කිරීම සඳහා තෝරා ගැනීම* :
ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% කට නොඅඩුව ලබාගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාව අනුව ඉහළම ලකුණු ලබාගත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන අයදුම්කරුවන් පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර කුසලතා අනුපිළිවෙළින් ඉහළ ලකුණු ලද සුදුස්සන් තත්ත්ව පාලන නිලධාරී II තනතුරට පත්කිරීම සඳහා තෝරා ගැනේ.

18. *ප්‍රතිඵල නිකුත් කිරීම* :
අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු ඇත.

19. *සාවද්‍ය තොරතුරු සැපයීම* :
අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද නිවේදනය බලාත්මක වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2024 ජනවාරි මස 24 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

02-32

## ධීවර අමාත්‍යාංශය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ආශ්‍රිත නිලධාරී සේවා ගණය) ධීවර නිලධාරී III ශ්‍රේණිය සඳහා රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන් අතුරින් බඳවා ගැනීමේ තරග විභාගය - 2024

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ආශ්‍රිත නිලධාරී සේවා ගණය) ධීවර නිලධාරී III ශ්‍රේණියේ තනතුරුවලට සුදුසුකම්ලත් දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීම තරග විභාගයක ප්‍රතිඵල මත සිදුකරන බවත් එම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2024 මැයි මස කොළඹ දී** පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2024 පෙබරවාරි මස 02 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2024 මාර්තු මස 01 වේ.**

දිවයින වටා පිහිටි වෙරළාසන්න දිස්ත්‍රික් ධීවර කාර්යාල 15ක හා ධීවර පරීක්ෂක කොට්ඨාස 149ක ධීවර නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු 50ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවයේ නිරත සුදුසුකම්ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම තනතුරෙහි රාජකාරි අතර වෙරළාශ්‍රිත ප්‍රදේශවල ක්ෂේත්‍ර රාජකාරීන්, නීති විරෝධී ධීවර කටයුතු මැඩපැවැත්වීම, ඒ ආශ්‍රිත, රාත්‍රී රාජකාරි යනාදියෙන් සමන්විත වේ.

1. සේවා කොන්දේසි :

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ධීවර නිලධාරී III ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :

වැටුප් කේත අංකය : MN4-2016
වැටුප් පරිමාණය : රු. 31,490- 10x445- 11x660-10x730-5x750-රු. 54,250/-

03. *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ධීවර විද්‍යාව, ධීවර හා සමුද්‍ර විද්‍යාව, ආහාර විද්‍යාව, ආහාර තාක්ෂණ විද්‍යාව, ආර්ථික විද්‍යාව, කළමනාකරණවේදය හෝ සමාජ විද්‍යාව යන එක් විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම හෝ එම විෂයයන්ගෙන් එකක් පාඨමාලාවේ ප්‍රධාන විෂයයන් ලෙස ඇතුළත් වූ උපාධියක් ලබා තිබීම.

04. *වෘත්තීය සුදුසුකම් :* අදාළ නොවේ.

05. *පළපුරුද්ද :* අදාළ නොවේ.

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක (ශ්‍රී ලංකා භූමියට අයත් දූපත් ද සහිත) විශේෂයෙන් වෙරළාශ්‍රිත ප්‍රදේශයේ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් :*

(i) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) අයදුම්පත් කැඳවන දිනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු විය යුතුය.
(ඩ) රා. සේ. කො. ච. ලේ. 1/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

08. *වයස් සීමාව :*
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2003.03.01 දින හෝ ඊට පෙර හා 1989.03.01 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

09. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත තරග විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ

අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 75%ක් වන සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන පිරිමි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ද බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 25%ක් වන සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන කාන්තා අයදුම්කරුවන් සංඛ්‍යාවක් ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යන දෙකේ ම ඒකාබද්ධ ලකුණුවල කුසලතා අනුපිළිවෙළින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 75%ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් හා 25%ක් කාන්තා අයදුම්කරුවන්ගෙන් ද පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවකු තමන් අයදුම්කළ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

10. ලිඛිත විභාගය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණය සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව හා බුද්ධිය පිළිබඳව මැනීම අරමුණු කොටගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. |
| 2. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය, ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි වැදගත් සිද්ධීන්ට අදාළව ද විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳව මූලික දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. |

11. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| පරිගණක සම්බන්ධ දැනුම | 15 | |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | 05 | |
| එකතුව | 50 | |

12. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර

විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න.

14. විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම :

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා දිනට අවසාන දිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකු ම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම දැන්වීමේ පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන්

තොරව විභාග ශාලාවට ඇතුළුවිය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. **සැලකිය යුතුය :**

අ. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

ආ. විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු අතර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් හා සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

17. **පත්කිරීම සඳහා තෝරා ගැනීම :**

ලිඛිත තරග විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 75%ක් වන සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන පිරිමි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ද බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 25%ක් වන සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන කාන්තා අයදුම්කරුවන් සංඛ්‍යාවක් ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යන දෙකේ ම ඒකාබද්ධ ලකුණුවල කුසලතා අනුපිළිවෙළින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් 75%ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් හා 25%ක් කාන්තා අයදුම්කරුවන්ගෙන් ද පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහළ ලකුණු ලද සුදුස්සන් පත්කිරීම සඳහා තෝරා ගැනේ.

18. ප්‍රතිඵල නිකුත් කිරීම :

අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු ඇත.

19. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහකිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැළපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2024 ජනවාරි 24 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

02-33

---

සංශෝධනය යි.

**විගණන සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සීමිත පදනමින් විගණන පරීක්ෂක සේවයේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය - 2023

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක අමප/23/0386/605/012-I(A) හා 2024 ජනවාරි 02 දිනැති ''රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සීමිත පදනමින් විගණන පරීක්ෂක සේවයේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2023'' සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 2023.10.27 දින ප්‍රකාශයට පත්කරන ලද අංක 2356 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 431 වැනි *ගැසට්* නිවේදනයට පහත සඳහන් සංශෝධන කරනු ලැබේ.

(I) ඉහත කී *ගැසට්* නිවේදනයේ මාතෘකාව ''රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සීමිත පදනමින් විගණන පරීක්ෂක සේවයේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය'' යන්න ''**රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සීමිත පදනමින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය**'' ලෙස සංශෝධනය විය යුතුය.

(II) ඉහත කී *ගැසට්* නිවේදනයේ ''විගණන පරීක්ෂක සේවයේ විගණන නිලධාරි තනතුර'' යන වචන යෙදී ඇති සෑම අවස්ථාවක දී ම ''**ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුර**'' ලෙස සංශෝධනය විය යුතුය.

(III) ඉහත කී *ගැසට්* නිවේදනයේ විභාග දිනය, අංක 1 ඡේදය, අංක 2(i) ඡේදය, අංක 3 ඡේදය, අංක 5(ii) ඡේදය, අංක 7(අ) ඡේදය හා 7(ඇ) ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතුය.

I. *විභාග දිනය* - විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 මැයි මස කොළඹ දී විභාගය පවත්වනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ විගණන සේවා කොමිෂන් සභාවට බලය ඇත.

II. I. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට විගණන සේවා කොමිෂන් සභාවට බලය ඇත.

III 2. (i) සාමාන්‍ය *ගැසට් පත්‍රයේ* I වැනි කොටස II (අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකර ඇති රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 2366/31 හා 2024 ජනවාරි මස 12 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට මින්මතු කෙරෙන සංශෝධනවලට ද සහ අංක අමපප23/0386/605/012-1 හා 2023 මාර්තු 08 දිනැති ''රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම'' සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ ඇතුළත් කොන්දේසිවලට ද අංක අමපප23/0386/605/012-I(A) හා 2024 ජනවාරි 02 දිනැති '' රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සීමිත පදනමින් විගණන පරීක්ෂක සේවයේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2023'' සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ ඇතුළත් කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට පත්කරනු ලැබේ.

IV. 3. *වැටුප් පරිමාණය* - ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට අයත් වැටුප් පරිමාණය ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව AS-01-A වැටුප් කේත අංකයට අදාළව මාසිකව රුපියල් 37,905-10 x 660 -11 x 775 - 15 x 930- රු. 66,760/- වේ.

V. 5. (ii) 2023 නොවැම්බර් 24 දිනට, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට අයදුම් කළ හැකි අතර, අයදුම්පත් කැඳවීමේ දිනට එම නිලධාරීන්ගේ වයස අවුරුදු 22ට නොඅඩු හා වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය. ඒ අනුව, 2001.11.24 දිනට හෝ ඊට පෙර හා 1983.11.24 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

VI 7. (*අ*) අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ ''Our Service'' යටතේ ඇති ''Online Application-Recruitment Exams'' ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2024.02.02** වැනි දින **පෙ. ව. 9.00**ට විවෘත වේ.

VII. 7. (*ඇ*) අයදුම්පත් භාරගැනීම **2024.03.01** වැනි දින **මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වේ.**

VIII. ඉහත කී *ගැසට්* නිවේදනයේ,

අංක 04 ඡේදයේ ''විගණකාධිපති විසින්'' යන්න ''**විගණන සේවා කොමිෂන් සභාව විසින්**'' ලෙස ද,

අංක 05 ඡේදයේ පළමු සටහනේ හා දෙවන සටහනේ (ආ) ඡේදයේ ''විගණකාධිපති විසින්'' යන්න ''**විගණන සේවා කොමිෂන් සභාව විසින්**'' ලෙස ද අංක 11 ඡේදයේ ''විගණකාධිපති විසිනි'' යන්න ''විගණන සේවා කොමිෂන් සභාව විසින්'' ලෙසද

අංක 13(ආ) ඡේදයේ ''විගණකාධිපති විසින්'' යන්න ''**විගණන සේවා කොමිෂන් සභාව විසිනි.**'' ලෙස ද, අංක14ඡේදයේ''විගණකාධිපතිවරයා සතුවේ.'' යන්න ''**විගණන සේවා කොමිෂන් සභාව සතුවේ.**'' ලෙස ද අංක 15 ඡේදයේ ''විගණකාධිපති වෙත'' යන්න ''**විගණන සේවා කොමිෂන් සභාව වෙත**'' ලෙස ද

අංක 16 ඡේදයේ ''විගණකාධිපතිවරයාගේ තීරණය'' යන්න ''**විගණන සේවා කොමිෂන් සභාවේ තීරණය**'' ලෙස ද සංශෝධනය විය යුතු ය.

(iv) මෙම නිවේදනයේ ඇතුළත් ඉහත කී සංශෝධන හැර 2023.10.27 දින ප්‍රකාශයට පත්කරන ලද අංක 2356 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදන අංක 431 වැනි *ගැසට් නිවේදනයේ* ඇතුළත් කරුණු (ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය ද ඇතුළුව) නොවෙනස්ව පවතී. ඒ අනුව දැනටමත් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

ඩී. කේ. විජේසිංහ,
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

2024 ජනවාරි මස 31 වැනි දින.

02-121

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **පෙබරවාරි** | 2024.02.02 | සිකුරාදා | 2024.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.09 | සිකුරාදා | 2024.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.16 | සිකුරාදා | 2024.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.22 | බ්‍රහස්පතින්දා | 2024.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2024.03.01 | සිකුරාදා | 2024.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.07 | බ්‍රහස්පතින්දා | 2024.02.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.15 | සිකුරාදා | 2024.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.22 | සිකුරාදා | 2024.03.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.28 | බ්‍රහස්පතින්දා | 2024.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.